Dela Bandara, Gamini, B. K. C. A. Wickramasinghe, Department of Sinhala, University of Kelaniya

**Parallel Session: Cultural Perspectives**

# සිංහල සාහිත්‍යය හා ජන සම්ප්‍රදාය

සිංහල සාහිත්‍යයේ ඇතැම් පද්‍ය හා නාට්‍ය නිර්මාණ ජන සම්ප්‍රදායට අයත් ලෙස ඇතැම්හු අර්ථ කථනය කරති. එසේ අර්ථකථනය කරන ලද බොහෝ නිර්මාණ ජන සම්ප්‍රදායට නො ව විදග්ධ සම්ප්‍රදායට අයත් ඒවා ලෙස සැලකිය හැකිය.

ජන සම්ප්‍රදායට අයත් ගායනා, නර්තන ආදිය පිළිබඳ වර්තමානයේ පිළිගත් අර්ථකථනය වන්නේ ඒවා සාක්ෂරතාවකින් තොර වූ මධ්‍යතන වැඩවසම් සමාජයේ ප්‍රවේණි දාසයන් ආදී නූගත් ජනයා විසින් කටවහරේ හෝ පාරම්පරික ව හෝ භාවිත කළ කලාවන් බවයි. ලක්දිව පවත්නා කවිනළු, සොකරි, කෝලම් ආදී නාට්‍ය සම්ප්‍රදායන් ද යසෝදරාවත, තුන්සරණය, වෙස්සන්තර ජාතක කාව්‍ය ආදී පද්‍ය කෘතීන් ද ජන සම්ප්‍රදායට අයත් නිර්මාණ ලෙස වර්ගීකරණය කිරීමට බොහෝ විද්වත්හු පෙලඹ සිටිති. එම වර්ගීකරණය මගින් සිංහල සාහිත්‍ය සම්ප්‍රදාය අවතක්සේරුවට පත් ව ඇති අතර, එම සාවද්‍ය හැඳින්වීම නිවැරදි කිරීමට කාලය එළඹ ඇත.